ඔබ සුජූද් කරන විට, ඔබේ අත් දෙක තබා ඔබේ වැළමිට දෙක ඔසවා ගන්න

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව බරාඃ (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබ සුජූද් කරන විට, ඔබේ අත් දෙක තබා ඔබේ වැළමිට දෙක ඔසවා ගන්න."
[صحيح] [رواه مسلم]

සලාතයේ සුජූද් ඉරියව්වෙහි දෙඅත් තිබිය යුතු ආකාරය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. එනම් අත් දෙක පොළොවෙහි තරකර තබා, ඇඟිලි ද කිබ්ලා දෙසට දිගු හැර, වැළමිට - එනම් අත හා බාහුව සන්ධි වන ස්ථානය - භූමිය ස්පර්ශ නොවන සේ ඔසවා තබා ඇළපත් දෙකින් ඒ දෙක ඈත් කර තබා ගැනීම ය.

http://sunnah.global/hadeeth/si/show/10927